මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

| නාට්‍ය හා රංග කලාව | **7 ශ්‍රේණිය** | **කාලය : පැය 02 යි** |
|---|---|---|

**ශිෂ්‍යයාගේ නම :-** ........................................................................................................................

සැලකිය යුතුයි,

- ❖ ප්‍රශ්න පත්‍රය I කොටස හා II කොටස වශයෙන් කොටස් දෙකකින් යුක්තයි.
- ❖ I කොටසේ ප්‍රශ්න සියල්ලටම හා II කොටසේ පළමු ප්‍රශ්න සහ තවත් ප්‍රශ්න දෙකකටද පිළිතුරු සැපයිය යුතුයි.

## I කොටස

1-5 දක්වා ප්‍රශ්න වල ඉදිරිපත් කර තිබෙන ප්‍රකාශය නිවැරදිනම් (✓) ලකුණද වැරදි නම් (×) ලකුණද ඉදිරියේ දී තිබෙන වරහන තුළ යොදන්න.

1) සාමාන්‍ය ජීවිතයේ සිදුවීම් හා අත්දැකීම් අතර නාට්‍යෝචිත අවස්ථා තිබේ. (................)

2) ටෙලි නාට්‍යය ප්‍රදර්ශනයේදී ප්‍රේක්ෂකයාගෙන් සෘජු ප්‍රතිචාර ලැබේ. (................)

3) ක්ෂණික නිරූපණයක් යනු පෙර සූදානමකින් තොරව පිටපතක් භාවිතයෙන් පුහුණුවකින් තොරව සිද්ධියක් හෝ අවස්ථාවක් රඟ දැක්වීමයි. (................)

4) කතා ගොතා කීමෙන් පරිකල්පන ශක්තිය වර්ධනය වේ. (................)

5) වෙස් මුහුණ පැළඳ ගැනීමෙන් රූපණයට අනුබලයක් ලැබේ. (................)

පහත දී ඇති වචන වලින් ගැලපෙන වචනය හිස්තැන් වලට යොදා වාක්‍ය අර්ථවත්ව සම්පූර්ණ කරන්න.

(රංග වස්ත්‍ර , උච්චාරණය , තේමාව , රංග අභ්‍යාස , වෙස් මුහුණ)

6) ගැමි නැටුම් , බලි තොවිල් , ශාන්ති කර්ම ආදියෙහි............................භාවිතා කරන ලදි.

7) නාට්‍යයකදී නළු නිළියන් විවිධ චරිත සඳහා අඳින ඇඳුම්...............................නමින් හැඳින්වේ.

8) සබකෝලය දුරුළීමට..............................ඉවහල් වේ.

9) විවිධ හැඟීම් පළකිරීම සඳහා හඬ................................වෙනස් කර ගත යුතුය.

10) කතා වස්තුව තුළින් මතුවන ප්‍රධාන අදහස නාට්‍යයක............................ලෙස හඳුන්වයි.

නිවැරදි පිළිතුර තෝරන්න.

11) නම්පොත භාවිතා කිරීමෙන් අභ්‍යාස කළ හැකි වන්නේ,

(1) හඬ අභ්‍යාසය (2) භාව නිරූපණ අභ්‍යාසය

(3) පරිකල්පණයකි (4) අනුරූපණයකි

12) පරිසරයේ ඇසුන නාදයක් නැවත කර පෙන්වීම

(1) අනුකරණ ක්‍රියාවකි (2) ප්‍රතිනිර්මාණයකි

(3) පරිකල්පණයකි (4) අනුරූපණයකි

13) ශරීරය සැහැල්ලු කර ගැනීම සඳහා සිදු කරන අභ්‍යාස හඳුන්වන්නේ,

(1) ශරීරය උණුසුම් කිරිමේ අභ්‍යාස (2) ශිථිලකරණය අභ්‍යාස

(3) ස්වසන අභ්‍යාස (4) රිත්මයානුකූල අභ්‍යාස

14) නාට්‍යයක සංවාද අයත් වන්නේ,

(1) සාත්වික අභිනයටය (2) වාචික අභිනයටය

(3) ආංගික අභිනයටය (4) ආහාර්ය අභිනයටය

15) සෝමා දේවි කතා පුවත

(1) ජනකතාවකි (2) ඓතිහාසික කතා පුවතකි

(3) ප්‍රබන්ධ කතාවකි (4) උපමා කතාවකි

16 – 20 දක්වා ප්‍රශ්න වලට දී ඇති අදහසට ගැලපෙන නිවැරදි පදය / උත්තරය වාක්‍ය ඉදිරියේ තිත් ඉර මත ලියන්න.

16) ඕනෑම රංගයක් ඉදිරිපත් කිරිම සඳහා භාවිතා වන ස්ථානය...............................

17) නාට්‍යයේ කතා වස්තුවෙන් කියවෙන දෙය..................................

18) අසා , කියවා , හෝ රඟ දැක්වීමෙන් රස විඳිය හැකි මාධ්‍ය.........................

19) චිත්‍ර සටහන් කැමරාවක් මඟින් රූගත කර ඉදිරිපත් කරන මාධ්‍ය...............................

20) නාට්‍ය ප්‍රචාරය සඳහා යොදා ගත හැකි විද්‍යුත් මාධ්‍යකි.....................................

(ලකුණු 20×1=20)

## II කොටස

සැලකිය යුතුයි

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 2කට පිළිතුරු සපයන්න.

(1) වැඩ ඇති විට අතපසු නොකරන් නේ
අද දවසට වැඩ අද කරපන් නේ
..................................................................
..................................................................

(1) මෙම කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න. (ලකුණු 02)
(2) මෙම කවිය ඇතුළත් කාව්‍ය ග්‍රන්ථය නම් කරන්න. (ලකුණු 02)
(3) එය රචනා කරන ලද්දේ කවුද? (ලකුණු 02)
(4) මෙය රචනා කර තිබෙන්නේ කුමක් අරමුණු කර ගෙනද? (ලකුණු 02)
(5) මේ කවියෙන් උපදේශාත්මක වැකියක් සාදා ලියන්න. (ලකුණු 02)

(2) (1) ජන ක්‍රීඩාවන් හතරක් නම් කරන්න. (ලකුණු 02)
(2) ඔබ ලියන ලද එක් ජන ක්‍රීඩාවකට අදාළ කවි දෙකක් ලියන්න. (ලකුණු 03)
(3) ජන ක්‍රීඩා තුළින් වර්ධනය කරගත හැකි ගුණාංග හතරක් දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

(4) (1) විද්‍යුත් ශ්‍රව්‍ය හා ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය දෙකක් නම් කරන්න. (ලකුණු 02)
(2) රස වින්දනය ලැබීමේදි මේ දෙක අතර පවතින වෙනස්කම් විස්තර කරන්න. (ලකුණු 03)
(3) වේදිකා නාට්‍යයක හා ටෙලි නාට්‍ය අතර පවතින සමානකම් කරුණු දෙකක් යටතේ විස්තර කරන්න. (ලකුණු 05)

(5) (1) ඓතිහාසික කතාවක් යනු කුමක්ද? (ලකුණු 02)
(2) ඓතිහාසික කතාවක් හා සම්බන්ධ වීර චරිත දෙකක් නම් කරන්න. (ලකුණු 03)
(3) එම චරිත වීරත්වයෙන් සැලකීමට හේතු වූ ප්‍රධාන කරුණු සඳහන් කරන්න. (ලකුණු 05)

(6) (1) ශිථිලකරණය යන්න කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02)
(2) ශිථිලකරණ අභ්‍යාසයක් සිදුකරන ආකාරය විස්තර කරන්න. (ලකුණු 03)
(3) ශිථිලකරණය අභ්‍යාස මඟින් ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියා විස්තර කරන්න.(ලකුණු 05)